# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 69 — 1973 ජූලි 20 වැනි සිකුරාදා — 1973.07.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II අ) වැනි ඡෙදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු .. .. .. | 871 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 889 |


**සැළකිය යුතුයි.—** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 22 දරන මෝටර් වාහන (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 23 දරන බඩු උගස් ගන්නන්ගේ (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 24 දරන නොතාරිස් (සංශෝධන) පනත 1973 ජූලි 20 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි

1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම් කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

" ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ " නව ප්‍රවේශක " රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

2. දීමනා

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුළුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

3. සේවා කොන්දේසි : සාමාන්‍ය

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත් වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9%ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ත් දක්වා වූ සෙච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතු නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත ඔවුනගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුව හොත් ඒ සඳහා ඔවුන් මුදාහැරිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

---

**අධිකරණ අමාත්‍යාංශය**

අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාගි ප්‍රධාන භාෂා පරිවර්තක (තාවකාලික) තනතුර

අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාගි ප්‍රධාන භාෂා පරිවර්තක (තාවකාලික) තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම අමාත්‍යාංශය මගින් සපයනු මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් 1973.03.15 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රජයේ සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්ද වූද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3. **වැටුප්.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය. වර්ෂයකට රුපියල් 8,800 න් පටන් ගෙන රු. 360 වාර්ෂික වැඩිවීම් 6 කින් හා රුපියල් 480 වාර්ෂික වැඩිවීම් 7 කින් යුතුව වර්ෂයකට රුපියල් 14,400 දක්වා වැඩිවන වැටුප් ක්‍රමයකි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට ඍතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1973.08.15 දිනට තම වයස අවුරුදු 25 කට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි බව. (දැනට රජයේ සේවයේ සිටින අයට මෙම උපරිම වයස් සීමාව බලපවත්වනු නොලැබේ.).

(සී) (i) විෂයයක් වශයෙන් සිංහල සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇති බව,

හෝ

(ii) ඉංග්‍රීසියෙන් ව්‍යවස්ථා අණපනත් ආදිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතු ය.

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකාන පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ).

(බී) උපාධි හෝ උසස් ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය/සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැලකිය යුතුයි :**

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු ඍජුව කෙළින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

නිහාල් ජයවික්‍රම,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

1973 ජූලි මස 10 දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

7–756—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

අංකය :—සුබෝ/ආය/2/17.

**සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව**

සහකාර ගොවිපල කළමනාකාර තනතුරු

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ සහකාර ගොවිපල කළමනාකාර තනතුරු සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් 1973 අගෝස්තු මස 15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 7, තැ. පෙ. 1524, ධර්මපාල මාවතේ අංක 159 දරණ ස්ථානයේ සුළු අපනයන බෝග අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් නොසපයේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "සහකාර ගොවිපල කළමනාකාර තනතුර" යන්න සඳහන් කළ යුතුය.

2. සේවයේ නියුක්ත කරලීමේ වගන්ති සහ කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම් ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3 ක ආධුනික කාලයක් මතය.

(ii) තෝරා ගනුලැබූ අපේක්ෂකයන් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් වන බැවින් ඔවුන්ට රජයේ නිවාඩු දිනයන් සහ ඉරිදා දිනයන් විවේක දිනයන් සේ සැලකීමට නොහැකි වේ. නමුත් තමා නැති අවස්ථාවන්හි තමාගේ රාජකාරිය නිසි ආකාරයට කිරීමට කටයුතු සලස්වා ඕනෑම දිනයක ඕනෑම වේලාවක විවේක ගැනීමට හැකිය,

(iii) තෝරා ගන්නා ලද අපේක්ෂකයින් තම පත්වීම ලබා අවුරුදු 3ක් ඇතුළත දී සිංහල පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා නියම සිංහල පරීක්ෂණ වලින් සමත්විය යුතුය. ප්‍රථම අවුරුද්ද තුළ දී දෙමළෙන් වැඩ කිරීමේ දැනුමක් ද ලබාගත යුතුය.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය.

ඒකාබද්ධ වැටුප: අවුරුද්දකට රු. 3,864—144 × 19 සහ 180 × 4—රු. 7,320 (අවුරුද්දකට රු. 4,584 සහ රු. 6,024 පෙර කාර්යක්ෂමතා කඩඉම් ක්‍රියාත්මක වේ.)

**සටහන.**—(i) පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධියක් හා පේරාදෙණියේ හෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් පළමුවැනි හෝ දෙවෙනි පෙළ සාමාර්ථයක් ලත් අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ අවුරුද්දකට රු. 3,864 මූලික වැටුප ලැබීමට ඔවුන් සුදුසුකම් ලබනු ඇත. මේ සියළුදෙනාම පත්වීමේ දින සිට අවුරුද්දක් ඇතුළත දී දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සිංහල/දෙමළ වාචික පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයෙන් නියමිත කාලය තුළදී සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වැඩි වීම ප්‍රමාද කිරීමට හේතු වේ.

(ii) පේරාදෙනියේ හෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ලත් අයදුම්කරුවන් හෝ අදාල විෂයයන් සහිතාව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හා ගොවිපල කළමනාකරුවකු වශයෙන් තුන් අවුරුදු පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් හෝ තෝරා ගනු ලැබුවහොත් අවුරුද්දකට රු. 3,180 වැටුප පමණක් ලැබීමට ඔවුන් සුදුසුකම් ලබන අතර, දෙපාර්තමේන්තු ආධුනිකයන්ගේ විභාගයෙන් සමත් වූ දින සිට ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ අවුරුද්දකට රු. 3,864 වැටුප් පියවරේ තබනු ඇත. මේ අයද පත්වීමේ දින සිට අවුරුද්දක් ඇතුළතදී දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සිංහල/දෙමළ වාචික පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයෙන් නියමිත කාලය තුළ සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වැඩිවීම ප්‍රමාද වීමට හේතු වේ. පත්වීමේ දින සිට අවුරුද්දක් ඇතුළතදී දෙපාර්තමේන්තුවේ ආධුනික විභාගයේ පළමු වන කොටස සමත් නොවන අය අවුරුද්දකට රු. 3,864 වැටුප ලැබීමට එම විභාගයෙන් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයෙක්

හෝ

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, අංක ගණිතය හෝ ගණිතය සහ වෙනත් විෂයයන් හතරකින් සාමාර්ථය ලබා ඉන් විෂයයන් පහක් එකම විභාගයේදී එකම වර සමත් වී ඇති අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතිකය හෝ ඊ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සාමාර්ථයක් ;

සහ

කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතිකය දරන්නෙකු විය යුතුය ;

හෝ

(iii) රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව ඇතුළුව විද්‍යා විෂයයන් තුනකින් එක වර එකම විභාගයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම ;

සහ

ගොවිපල කළමනාකරුවකු වශයෙන් තුන් අවුරුදු පළපුරුද්දක් තිබිය යුතුය.

(ආ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 22කට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුතු අපේක්ෂකයින් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බල නොපැවැත් වේ.) ;

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික බාරගනු නොලැබේ) ;

(ආ) උසස්ම අධ්‍යාපනික සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික . .

(ඇ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය ;

(ඈ) ගොවිපල පාලනය පිළිබඳ පළපුරුද්ද පිළිබඳ සහතික. (අදාල වේ නම්) ;

(ඉ) ළඟදී ලබා ගත් චරිත සහතික දෙකක් (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් මෙම උප වගන්තිය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත).

**සංලක්ෂ්‍යය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දිනට හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතු යයි නිර්දේශ නොකරතොත් සලකා බලනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කොළඹ 7, තැ.පෙ. 1524, ධර්මපාල මාවතේ අංක 159 දරණ ස්ථානයේ සුළු අපනයන බෝග අධ්‍යක්ෂට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ආචාර්ය ඊ. ජයනෙත්ති,
සුළු අපනයන බෝග අධ්‍යක්ෂ.

1973ක් වූ ජූලි මස 07 දින,
කොළඹ 7, තැ.පෙ. 1524, 159, ධර්මපාල මාවතේ
සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

සහකාර ගොවිපල කළමනාකාර තනතුර—සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.

2. ලිපිනය :————

3. උපන් දිනය සහ 19973 අගෝස්තු මස 15 වැනි දිනට වයස : ————.

4. ජාතිය හා එය කෙසේ ලබාගත්තේ ද යන වග :————.

5. උපන් ස්ථානය—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) ඔහුගේ පියාගේ :————.
   (ඇ) ඔහුගේ පියපස මුත්තාගේ :———— .
   (ඈ) ඔහුගේ පියපස මී මුත්තාගේ :———— .

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
   (ආ) ඔබ විවාහක ද/අවිවාහක ද/වැන්දඹුවක් ද යන බව: ————.

7. ලබා ඇති අධ්‍යාපනික හා/හෝ වෘත්තීය සුදුසුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

8. සිංහල විෂයයෙන් සමත් වූ පරීක්ෂණය :———— –
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

9. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? එසේ නම් දැරූ ධුරය සහ ඉන් අස් වීමට හේතු සඳහන් කළ යුතුය: ————

10. යම්කිසි විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පළපුරපුරුද්දක් ඇති නම් සඳහන් කරන්න :————.

11. චරිත සහතික ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ තනතුරු නාමය :————.
    (සහතික පිටපත් ඇමිණිය යුතුය)

12. වෙනත් විස්තර තිබේනම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ කරන ලද තොරතුරු සත්‍ය බව සහ නිවැරදි බව සහතික කරමි. එම තොරතුරු අසත්‍ය බව තෝරා ගැනීමට පෙර ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය. :————.

7-664—73.07.20 දින. අංක 69 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා නාවික හමුදාවේ නැව් කාර්මික ශිල්පී (සිවිල්) තනතුරු සඳහා ඇබෑර්තු

ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ නැ.කා.ශි. (සිවිල්) තනතුරු සඳහා ඉදිකිරීම්/නැනීම් සම්බන්ධව පළපුරුදුකම් ඇති අය ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ට නියමිත සුදුසු කම් තිබිය යුතු අතර පහත සඳහන් කොන්දේසි ද සපුරාලිය යුතුය.

2. සෑම අපේක්ෂකයෙකුම පහත විස්තර කර ඇති සියලුම කොන්දේසි සපුරාලිය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වීම,

(ආ) සිංහල භාෂාව/හෝ දෙමළ භාෂාව සහිතව ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්ව තිබීම සහ පහත සඳහන් විෂයයන්ගෙන් සම්මාන දෙකකට නොඅඩුව තිබීම :—

| | |
|---|---|
| (i) ශුද්ධ ගණිතය | (iv) ව්‍යවහාරික ගණිතය |
| (ii) භෞතික විද්‍යාව | (v) රසායන විද්‍යාව |
| (iii) උසස් ගණිතය | (vi) ජ්‍යාමිතික/යාන්ත්‍රික ඇඳීම : |

(ඇ) පහත සඳහන් කාර්මික සුදුසුකම් වලින් එකක් වත් තිබිය යුතුය.

(i) ලංකා කාර්මික විද්‍යාලයේ කනිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සිවිල්) පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම (හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම), සහ රජයේ කාර්මික දෙපාර්තමේන්තුවක/සංස්ථාවක අවුරුදු 3 ක පළපුරුද්දක් තිබීම හෝ පිළිගත් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමග සිවිල් ඉංජිනේරු රාජකාරී කර තිබීම ;

(ii) ලංකා කාර්මික විද්‍යාලයක ගොඩනැගිලි ඉදිකිරීම/සැලසුම් ඉංජිනේරු/සමස්ථ ඉංජිනේරු සන්ධ්‍යා පාඨමාලාව සාර්ථක ලෙසින් සම්පූර්ණ කර තිබීම සහ අවුරුදු 4 ක පාලක තත්ත්වයක ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම

හෝ

(iii) රජයේ ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක කනිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සිවිල්) ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථක ලෙසින් සම්පූර්ණ කොට තිබීම සහ රජයේ කාර්මික දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පෞද්ගලික සමාගමක වගකිව යුතු තත්ත්වයක වැඩ පරිපාලනය කිරීම පිළිබඳ අවුරුදු 3 ක පළපුරුද්දක් තිබීම ;

(iv) උප පරීක්ෂකවරුන් (සිවිල්) වශයෙන් උසස් කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්මික නිලධාරීන්ගේ පරීක්ෂණයේ අඩු වශයෙන් පහත සඳහන් විෂයයන්ගෙන් පහකින් වත් සමත් වී තිබීම :—

ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තුව
ප්‍රමාණ ගැනීම හා ඇස්තමේන්තු කිරීම
වාස්තු විද්‍යාත්මක හා සැලසුම් ඇඳීම
මැනීම හා මට්ටම් කිරීම (න්‍යාය)
මැනීම හා මට්ටම් කිරීම (ක්ෂේත්‍ර කටයුතු)
ජල සම්පාදනය හා ජලාප්‍රවාහනය
පාලම් හා විශාල නැනීම්
පාරවල් තැනීම හා නඩත්තුව ;

සහ

යකඩ කම්බි යොදා ශක්තිමත් ලෙස ගොඩනංවන සිමෙන්ති කොන්ක්‍රීට් වැඩ/යකඩ වැඩ තැනීම්/ගොඩනැගිලි නඩත්තු වැඩ/පරිමාණ ලදුපත් සැකසීම හා ඇස්තමේන්තු කිරීම්/ඉදි කිරීම් ස්ථාන වල කම්කරු වැඩ පරීක්ෂා කිරීම ආදී වැඩ පිළිබඳ අවුරුදු 3 ක පළපුරුද්දක් තිබීම

(ඈ) 1973 සැප්තැම්බර් 01 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(ඉ) පහත සඳහන් අවම ශාරීරික අවශ්‍යතාවයන් තිබීම :—

(i) උස : අඩි 5 අඟල් 4

(ii) බර : රාත්. 105

(iii) පපුවේ මිණුම : අඟල් 32
(පුළුල් නොකර)

(ඊ) නාවික හමුදාපති සෑහීමකට පත්වන වෛද්‍ය පරීක්ෂණයකට සමත් වීම.

3. තෝරා ගැනීමට ප්‍රථම අපේක්ෂකයන්ට පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවනවා ඇත.

4. විශේෂඥ රාජකාරීවල නිරත කිරීමට ප්‍රථම අපේක්ෂකයින්ට සති 2-4 ක කාලයක පුහුණුවක් ලබාදෙනු ඇත.

5. තෝරා ගනු ලබන අපේක්ෂකයින් බඳවා ගනු ලබන දින වලංගුව පවතින (1950 දෙසැම්බර් 09 දින අංක 10,187 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ) වරින් වර සංශෝධනය කරනු ලැබූ 1950 නාවියන් බඳවා ගැනීමේ හා සේවා රෙගුලාසි මත සේවා කොන්දේසි පාලනය වේ. දැනට නිත්‍ය නාවික බලකායට බඳවා ගනු ලබන ඕනෑම නාවියකුගේ මුල් කාලසීමාව අවුරුදු 12 කි. නාවික හමුදපති විසින් අවුරුදු 20 කට වැඩි නොවන කාලයක් සඳහා නැවත සේවයට බැඳීමට ඔහුට ඉඩදෙනු ඇත. සාමාන්‍යයෙන් නාවියෙකුට අවුරුදු 22 ක සම්පූර්ණ කාලයක් සේවය කිරීමට ඉඩ දෙනු ලැබේ.

6. මෙම තනතුරුවලට අදාළ වන වැටුප් පරිමාණයන් 1970 නාවික වැටුප් සංග්‍රහය අනුවය. ප්‍රසිද්ධ කර ඇති තනතුරුවලට අදාළ වන වැටුප් පරිමාණයන්ගේ උධෘත මෙසේය :—

| | I වැනි කාණ්ඩයේ වැටුප් පරිමාණය | විශේෂ කාණ්ඩයේ වැටුප් පරිමාණය |
|---|---|---|
| II වැනි හෝ III වැනි පන්තියේ ශිල්පීන් | 4,920—10 × 90 ... 5,82 | — |
| I වැනි පන්තියේ ශිල්පී හෝ ප්‍රධාන ශිල්පී | — | ... 5,940—10 × 90— 6,840 |
| පාලක ප්‍රධාන සුළු නිලධාරි ... | — | ...6,840—10 × 144— 7,920 |

පහත සඳහන් දීමනා අදාළ වනු ඇත :—

(අ) විවාහක දීමනාව ... ආණ්ඩුවේ සේවාවේ ඇති පරිපාටි පරිමාණ සහ කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

(ආ) රජක දීමනාව ... (i) නේවාසිකාගාරයක වෙසෙන නාවියෙකුගේ නිල ඇඳුම් නාවික හමුදා වියදමෙන් සෝදා ගැනීමට හිමිකම් ඇත.

(ii) නේවාසිකාගාරයකින් පිටත වෙසෙන නාවියෙකුට ඔහුගේ නිල ඇඳුම් සේදීම පිණිස නාවික හමුදාධිපති විසින් නියම කරනු ලබන දීමනාවකට හිමිකරුවෙකු වනු ඇත. කොන්ත්‍රාත්කරුවකු ඇති ප්‍රදේශ වල දැනට පවත්නා පරිමාණය මසකට රු. 4.

(ඇ) යහපත් හැසිරීම සඳහා ගෙවීම පහත සඳහන් ප්‍රමාණයන් අනුව යහපත් හැසිරීමේ ලාංඡන හිමි සෑම නාවියෙකුටම ඔහුට අදාළ වන පරිදි යහපත් හැසිරීම සඳහා ගෙවීම් දෙනු ලැබේ.

| | දෛනික ප්‍රමාණය රු. ශ. |
|---|---|
| (i) එක් ලාංඡනයකට—අවුරුදු 4 ක සුදුසුකම් ලැබීමේ සේවා කාලයකින් පසු ... ... | 0 25 |
| (ii) ලාංඡන දෙකකට—අවුරුදු 8 ක සුදුසුකම් ලැබීමේ සේවා කාලයකට පසු ... ... | 0 50 |
| (iii) ලාංඡන තුනකට—අවුරුදු 12 ක සුදුසුකම් ලබන සේවා කාලයකින් පසු ... ... | 0 75 |

පළකර ඇති තනතුරු සුළු නිලධාරි (නාවික හමුදාවේ) හෝ සැරයන් (යුද්ධ හමුදාවේ) තත්ත්වයකට සමානය. අධිකාරී නොලත් නිලයේදී යුද්ධ හමුදාවේ I වැනි පන්තියේ බලලත් නිලධාරී තත්ත්වය හා සමාන පාලක ප්‍රධාන සුළු නිලධාරී (නාවික හමුදාවේ) තත්ත්වය දක්වා උසස් විය හැක. අධිකාරියක් ඇරීමට සුදුසු යයි පෙනී ගිය අවස්ථාවලදී කාර්මික නිලධාරීන් වශයෙන් අධිකාරී ධුරයන්ට පත් කිරීමටද අවස්ථා ඇත.

7. බඳවා ගැනීම සඳහා කෙරෙන ඉල්ලුම් පත් පහත සඳහන් නීතිරීති අනුව විය යුතුය.

(අ) මෙම නිවේදනය අවසානයෙහි දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරුගේ අත් අකුරෙන්ම ඉල්ලුම් පත් ලියා තිබිය යුතුය.

(ආ) ඉල්ලුම්පත්, කොළඹ 1, තැ. පෙ. 593, ශ්‍රී ලංකා නාවික හමුදාවේ බඳවා ගැනීමේ නිලධාරී වෙත එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ උඩ "බඳවා ගැනීම—ශිල්පී අංශය" යනුවෙන් ලියා 1973 සැප්තැම්බර් 01 වැනි දින ප.ව. 3.30 ට පෙර නාවික හමුදා මූලස්ථානයට ලැබිය යුතුය. රජයේ සේවකයන්ගේ ඉල්ලුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, තෝරාගනු ලැබුවහොත් අයැදුම්කරු මුදා හැරිය හැකි බව සඳහන් ලිපියක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් මේ සමග එවිය යුතුය.

(ඇ) ඉල්ලුම් පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් පමණක් එවිය යුතුය.

(i) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ උපත ලියා පදිංචි නොකරනු ලැබූ අයැදුම්කරුවන් වෙනුවෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන විශේෂ වයස් සහතිකය.

සැ. යු.—වයස සනාථ කිරීම පිණිස බෞතිස්ම සහතික, උපකාරක පාඨශාලා ව්‍යවස්ථා සඳහා නිකුත් කෙරෙන උප්පැන්න සහතික, සඳහන් ආදිය භාරගනු නොලැබේ.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික සහ මෙම දැන්වීමේ 2 (ආ) ඡේදයේ සඳහන් වන අධ්‍යාපනික අවශ්‍යතා සනාථ කිරීමේ සහතික.

(iii) මෙම දැන්වීමේ 2 (ඇ) ඡේදයෙන් සඳහන් කර ඇති පරිදි හැකිනම් ලබා ඇති කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) පත්වීම සඳහා අයැදුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ යෝග්‍යතාවය පිළිබඳ මෑත දී ලබාගත් චරිත සහතික හතරක්, ඉන් එකක් තම ප්‍රදේශයේ ග්‍රාම සේවකගෙන් විය යුතු අතර අනෙක තමාගේ වර්තමාන හෝ මීට ප්‍රථම හෝ සේවා යෝජකයාගෙන් විය යුතුය.

(v) අයැදුම්කරුගේ ඉකුත් උපන් දිනයේ දී හෝ ඊට පසුව ගත් ඡායාරූපයක් ද එවිය යුතුය. එහි පසුපිටෙහි අයැදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**සටහන.**—උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සහතිකයෙහි සහ අධ්‍යාපනික සහතිකවල අයැදුම් පත්‍රයේ සඳහන් කර ඇති නම නොවෙනස්ව තිබිය යුතුය. අයැදුම් පතෙහි සහ ඡායාරූපයෙහි යොදන අත්සන අයැදුම්කරුගේ සාමාන්‍ය අත්සන විය යුතුය.

8. ස්ථිර නාවික බලකායට බඳවා ගැනීම පිණිස තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 වර්ෂයේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ද, බඳවා ගනු ලබන අවස්ථාවේ දී රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම්වස් නිකුත් කර ඇති හෝ නිකුත් කරනු ලබන හෝ සියළුම නියෝග හා උපදෙස් අනුගමනය කරන බවට ලිය විල්ලකින් ශිවිසිය යුතුය.

9. සේවාමුක්ත භටයකු මේ සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඉහත සඳහන් කර ඇති පොදු කොන්දේසිවලට අමතරව පහත සඳහන් දෑද සපුරා ලිය යුතුය.

(i) ඔහුට බ්‍රිතාන්‍ය පොදුරාජ්‍ය මණ්ඩලීය සන්නද්ධ සේවාවක හෝ ලංකාවේ හමුදාවක අවුරුද්දකට නොඅඩු සේවා කාලයක් ඇති බවට

(ii) සන්නද්ධ සේවයෙන් මුදාහරිනු ලැබූ විට ඔහුගේ පූර්ව සේවය "ඉතා හොඳයි" තත්ත්වයට වඩා නොඅඩුව වර්ග කර ඇති බවට

(iii) ඔහුගේ සක්‍රිය සේවා කාලයේ අවුරුදු මාස හා දින ගණන.

10. සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අයැදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට පමණි. ඉල්ලුම් පත සමග එවන කිසිම ලේඛනයක මුල් පිටපතක් නැති වුවහොත් නාවික හමුදා මූලස්ථානය වගකියනු නොලැබේ.

11. තැපැල්දී නැතිවන හෝ ප්‍රමාද වන ඉල්ලුම් පත් පිළිබඳ කෙරෙන චෝදනාවන් ගැන සලකා බලනු නොලැබේ.

12. ලැබෙන සියළුම ඉල්ලුම්පත් ලද බැව් දන්වනු ඇත.

13. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවනු ලබන ඉල්ලුම්පත් ඒවා භාරගන්නා අවසාන දිනට පසුව මෙම කාර්යාලයට ලැබුණේ නම් භාරගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී ඔහු විසින් ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් කළහොත් පමණක් භාරගනු ලැබේ.

14. සුදුසු සේ සැලකෙන අයැදුම්කරුවන් ලිපියකින් දන්වා එවන දින සහ වේලාව අනුව නාවික හමුදා තේරුම් මණ්ඩලය මගින් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කීපයක් සඳහා පෙනී සිටීම අවශ්‍යය. සම්මුඛ පරීක්ෂණ වලින් බඳවා ගැනීම සඳහා සුදුසු යයි තෝරනු ලැබූ අයැදුම්කරුවන් බඳවා ගැනීමට පෙර කොළඹ දී පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ කීපයක් සඳහා ද ඉදිරිපත් විය යුතුය. සම්මුඛ පරීක්ෂණ හෝ වෛද්‍ය පරීක්ෂණ සඳහා ගමන් ගාස්තු හෝ වෙන කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

15. ඉල්ලුම්කරුවකු නිර්දේශ කිරීමට කැමති කෙනෙකු වේ නම්, ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුවකුගේ තෝරා ගැනීම පිළිබඳව යම්කිසි පෙළඹවීමක් හෝ බලපෑමක් සඳහා ප්‍රයත්නයක් දරනු ලබන්නේ නම් ඒ හේතුවෙන් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සකු වීමට ඉඩ තිබේ.

16. යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරාගැනීමට පෙර සොයා ගන්නේ නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු බවට පත් කිරීමටත්, බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුනි නම් විනයානුකූලව ක්‍රියා කිරීමට සහ නාවික හමුදාවෙන් පහ කිරීමටත් ඉඩ තිබේ.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදාපති.

1973 ජූලි මස 04 දින,
කොළඹ දී ය.

අයැදුම් පත්‍රය

නැවියන් සඳහා ඇබෑර්තු—ශ්‍රී ලංකා නාවික හමුදාව

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්):————.
2. තැපැල් ලිපිනය :————.
3. පලාත :————.
4. උපන් දිනය :————.
5. 1973 සැප්තැම්බර් 01 වැනි දිනට වයස :————.
6. සමර්ථවී ඇති විෂයයන් සහ දිනයන් සහිතව අධ්‍යාපනික සුදුසුකම් :————.
7. ඉගෙනීම ලැබූ පාසල් :————.
8. වෙනත් සුදුසුකම් :————.
9. ක්‍රීඩා පිළිබඳ දක්ෂතාවය :————.
10. පාසැල් හැරයාමේ සිට රැකියාවල් (සම්පූර්ණ විස්තර) :————.
11. දැන් රැකියාව :————.
12. උස : අඩි :————. අඟල් :————. බර : රාත් :————. පපුව : අඟල් :————.
13. ජාතිය :————.
14. ආසන්න පොලිස් ස්ථානය :————.
15. නාවික, යුද්ධ, ගුවන් හමුදා සහ ස්වේච්ඡා සේවා ඇත්නම්, එහි සම්පූර්ණ විස්තර :————.
16. මුදාහැරීමේදී/අස්කිරීමේදී හැසිරීම :————.
17. වෙනත් අදාළ විස්තර :————.
18. සහතික ඉදිරිපත් කරන්නන්ගේ නම් සහ තනතුරු :————.
    (අ) ......................කොට්ඨාශයේ ග්‍රාම සේවක
    (ආ)
    (ඇ)
    (ඈ)

ඉහත සඳහන් විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–569—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

### අධ්‍යාපන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ පැවැත්වෙන 1974 වර්ෂයේ එක් අවුරුදු අභ්‍යන්තර අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධි පාඨමාලාව සහ දෑවුරුදු තැපැල් මාර්ගික අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධි පාඨමාලාව**

ඉහත සඳහන් පාඨමාලාවට හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයදුම් පත් කැඳවමින් 1973 ජූනි 22 දින අංක 65 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී ඇති දැන්වීම හා සම්බන්ධවයි.

2. එම නිවේදනයේ 4 වන ඡේදයේ ඊ (i), ඊ (ii) සහ (ඌ) අනුඡේදයන් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :—

ඊ(i) උපාධිධාරී වැටුප් ක්‍රමය යටතේ උපාධිධාරී ගුරු පත්වීමක් ලැබ 1974. 01. 01 දිනට අවුරුදු 5 කට නොඅඩු කාලයක් රජයේ විද්‍යාලක හෝ ගුරු විද්‍යාලක හෝ රජයේ කාර්මික අධ්‍යාපන ආයතනයක හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්

ඊ(ii) 1974. 01. 01 දිනට අවුරුදු 10 කට වැඩි ගුරු සේවයක් ඇත්තාවූද, ඉන් අවුරුදු 3 කට නොඅඩු කාලයක් උපාධිධාරී වැටුප් ක්‍රමය යටතේ උපාධිධාරී ගුරුවරයෙකු වශයෙන් රජයේ විද්‍යාලක හෝ ගුරු විද්‍යාලක හෝ රජයේ කාර්මික අධ්‍යාපන ආයතනයක හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ඇත්තාවූද විය යුතුය.

(ඌ) මීට පෙර අධ්‍යයන නිවාඩු ලබා ගැනීම සඳහා බැඳුම්කර අත්සන් තබා ඇති ගුරුවරුන් අභ්‍යන්තර එක් අවුරුදු පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍ර එවීමට සුදුසු වන්නේ, ඔවුන් විසින් අත්සන් තබා ඇති බැඳුම්කර අනුව සේවය කිරීමට බැඳී ඇති කාලසීමාවෙන් අඩුම වශයෙන් අවුරුදු 5 ක කාලයක් 1973 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබේ නම් පමණකි. එසේ සම්පූර්ණ කර නොමැති අය විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. එම නිවේදනයේ 4 වන ඡේදයේ ඊ(i) සහ (ii) අනුඡේදයන්හි නියමයන් ලංකා අධ්‍යාපන සේවයට අයත් උපාධිධාරී නිලධාරීන් සම්බන්ධයෙන් අදාල නොවේ.

4. ඉල්ලුම් පත් භාර ගැනීමේ අවසාන දිනය 1973 අගෝස්තු 04 දින දක්වා දීර්ඝ කරන ලදී.

5. තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය 1973.09.15 දින පවත්වනු ලැබේ.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජූලි මස 4 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේදීය.

7–759—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

### ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

පුරප්පාඩු

විලවේ යෝජනා ක්‍රමයෙහි පහත දැක්වෙන තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

**I ප්‍රධාන ගණකාධිකාරී.**

අයදුම්කරුවන් අවුරුදු 30 ටත් 45 ටත් අතර විය යුතුයි. පහත සඳහන් සුදුසුකම් ඔවුන්ට තිබිය යුතුයි :—

1. වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ පිරිවැය සහ පාලනය පිළිබඳ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමර්ථවී, රජයේ සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක දෛනික මුදල් පරිපාලනය, අයවැය වාර්තා පිළියෙල කිරීම සහ අනුකලන පිරිවැය/මුදල් ගණකාධිකරණ ක්‍රම පිළිබඳව පශ්චාත් සුදුසුකම් දැක්වෙන අවුරුදු පහක අවම පළපුරුද්දක් තිබීම.

2. මණ්ඩලයේ සේවයෙහි II/III ශ්‍රේණියේ අවුරුද්දකට රු. 15,840—5×480 සහ 5×600—රු. 21,240 දරණ වැටුප් පරිමාව මත පත්වීම දෙනු ලැබේ. වැටුප් පරිමාවෙහි පියවරකට පත් කිරීම ගැන සලකා බලනු ලැබේ.

**II. ප්‍රධාන අභ්‍යන්තර ගණන් පරීක්ෂක.**

අයදුම්කරුවන් අවුරුදු 30 ටත් 45 ටත් අතර විය යුතුයි. පහත සඳහන් සුදුසුකම් ඔවුන් සතු විය යුතුයි :—

1. වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ පිරිවැය සහ පාලනය පිළිබඳ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමර්ථවී රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අභ්‍යන්තර ගණන් පරීක්ෂා කිරීම් පිළිබඳ පශ්චාත් සුදුසුකම් දැන්වෙන අවුරුදු පහක අවම පළපුරුද්දක් තිබීම. නිර්මාණ හෝ නිෂ්පාදන කටයුතු පිළිබඳ යෝජනා ක්‍රමයක ලත් පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

2. මණ්ඩලයේ සේවයෙහි II/III ශ්‍රේණියේ අවුරුද්දකට රු. 15,840—5×480 සහ 5×600—රු. 21,240 දරණ වැටුප් පරිමාව මත පත්වීම් දෙනු ලැබේ. වැටුප් පරිමාවෙහි පියවරකට පත් කිරීම ගැන සලකා බලනු ලැබේ.

වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ මධ්‍යම පරීක්ෂණයෙන් හෝ පිරිවැය සහ පාලනය පිළිබඳ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ I, II, III සහ IV වැනි කොටස් වලින් සමර්ථවී ගිණුම් කටයුතු පිළිබඳ අවුරුදු 10 ක පළපුරුද්දක් ඇති මණ්ඩලයේ සේවයෙහි නියුතු මණ්ඩලික නිලධාරීන්ගෙන් ද අයදුම්පත් සලකා බලනු ලැබේ.

මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍රවල අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ආකෘති පත්‍ර තැපැලෙන් ගෙන්වා ගැනීමට ඉල්ලුම් කරන්නේ නම්, තමන්ගේ නම සහ ලිපිනය සහිත මුද්දර ගැසූ කවරයක් සමග ඉල්ලුම් කළ යුතුයි.

අයදුම් පත් 1973 අගෝස්තු මස 15 වෙනි දින හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ මෙහි පහත අත්සන් කර ඇති අය නමට එවිය යුතුයි.

සභාපති,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7, 1973.07.09.

7–744—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

### ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් කරුවන්ගේ වයස, ඉල්ලුම්පත් බාර ගන්නා අවසාන දිනට අවුරුදු 45 ට වැඩි නොවිය යුතු අතර අවුරු 18 ට අඩු නොවිය යුතුය. ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුත්තේ මෙම කාර්යාලයෙන් ලබා ගත යුතු නියමිත ආකෘති පත් අනුවය.

1. (අ) **තනතුර :** ගබඩා භාරකරු (IV වන ශ්‍රේණිය).
   (ආ) **සුදුසුකම් :** සම්මාන 04 ක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම සහ පිළිගත් වාණිජ හෝ කාර්මික ආයතනයක ගබඩා කටයුතු පිළිබඳ අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්ද.
   (ඇ) **වැටුප් පරිමාණය :** රු. 280—10×7—රු. 350.
   (ඈ) **සුරකුම් :** රු. 10,000 ඇපයක් තැබිය යුතුය. ඉන් රු. 2,000 ක් මුදලින් ද, ඉතිරිය ඇප ආරක්ෂණයකින් ද තැබිය යුතුය.

2. අයදුම්කරුවන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද සළකා බැලීමෙන් පසුව අදාළ වැටුප් පරිමාණයේ සුදුසු වැටුප් තලයක පිහිටුවා පත්වීම ප්‍රදානය කිරීම සම්බන්ධව සලකා බලනු ලැබේ.

3. ඉල්ලුම්පත් හා විස්තර, ලිපිනය සහිතව මුද්දර ගැසූ ලියුම් කවරයක් මා වෙත එවීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ හෝ ලබා ගත හැකිය.

4. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රාජ්‍ය සංස්ථාවල සේවයෙහි නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් සේවා යෝජකයා මගින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්පත් 73.08.04 වෙනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

සේවක මණ්ඩල කළමනාකරු.

ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව,
පළමු මහල, චාර්ටඩ් බැංකු ගොඩනැගිල්ල,
රැජින වීදිය, කොළඹ 1.

7–748—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

II පෙළ සැලසුම්කරු තනතුරු

1973 ජුලි මස 06 දින රජයේ ගැසට් පත්‍රයේ පළ වූ II පෙළ සැලසුම් කරු තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවීමේ දැන්වීමට අමතර වශයෙනි.

ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය **1973.07.31 වෙනි දින** දක්වා දීර්ඝ කරන ලදී.

ජේ. බී. වීරරත්න,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජුලි මස 07 දින
කොළඹ 1, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේදිය.

7–587—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**ජාතික ආධුනිකත්ව මණ්ඩලය**

ශිල්පුම් සහකාර තනතුර සඳහා ඇබෑර්තුව

ඉහත සඳහන් ඇබෑර්තුව වෙනුවෙන්, පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) යටත් පිරිසෙයින් 3 ක් අවුරුද්දකට වැඩ පළපුරුද්ද සහිත, ගණකාධිකාරී ඩිප්ලෝමාව හෝ ඒ.සී.එම්.ඒ. (I, II සහ III කොටස) හෝ සමාන සුදුසුකම්

හෝ

අවුරුදු 10 කට වැඩි සේවා කාලයක් සහිත, ශිල්පුම් කටයුතුවල නිරතව සිටි සංස්ථා හෝ මණ්ඩලවලට අයත් නිලධරයන් ;

(ආ) සිංහල පිළිබඳ ඉතා හොඳ දැනුමක් තිබිය යුතුය.

(ඇ) **සංස්ථා හෝ මණ්ඩලවලට අයත් නිලධරයන් හැරුණ විට** බාහිර අයදුම්කරුවන් වයස අවුරුදු 35 ට නොවැඩි අය විය යුතුය.

2. ඉහත තනතුරට අදාළ සියල්ල අඩංගු මාසික වැටුප් පරිමාණය රු. 550—25—රු. 850 වනු ඇත.

3. **රැකියා පිළිබඳ කොන්දේසි.**—(i) තෝරාගනු ලබන අයදුම්කරු—

(අ) ශාරීරික යෝග්‍යතාවය සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණය කින් සමත් විය යුතුය.

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවනු සඳහා සවකීය පරිවාස කාලසීමාව ඇතුලතදී මණ්ඩලය විසින් නියම කරනු ලබන මට්ටමක, රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(ඇ) සේවක අර්ථ සාධක අරමුදල වෙනුවෙන් ස්වකීය වැටුපෙන් 6% ක දායක මුදලක් ගෙවිය යුතුය. (මණ්ඩලයේ දායක දීමනාව 9% කි).

(ii) තෝරාගැනීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරු අවුරුදු 3 ක පරිවාස කාලයක් මත පත් කරනු ඇත.

4. 1973 ජුලි මස 31 වන දිනට පෙර ලැබෙන පරිදි අයදුම් පත් එවිය යුතු අතර, සංස්ථාවලට හෝ මණ්ඩලවලට අයත් නිලධාරීන් විසින් ස්වකීය අයදුම්පත් අදාළ සංවිධානයේ ප්‍රධානියා මගින් එවිය යුතුය. සියළුම අයදුම්පත් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

5. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලබන අතර, මෙම දැන්වීමේ අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ඇත.

6. මණ්ඩලයෙහි යහපත සඳහා අවස්ථානුකූල නොවේයයි සලකනු ලැබුවහොත්, එවැනි අයදුම්කරුවකු පත්නොකිරීමේ අයිතිය මණ්ඩලය සතුව තබා ගනු ඇත.

සහකාර අධ්‍යක්ෂ (මුදල්),
ජාතික ආධුනිකත්ව මණ්ඩලය,
30, විජේරාම මාවත,
කොළඹ 7.

ඩී. ආර්. එල්. බාලසූරිය,
සභාපති,
ජාතික ආධුනිකත්ව මණ්ඩලය.

1973 ජුලි මස 05 දින,
30, විජේරාම මාවත,
කොළඹ 7.

7–707—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**අංකය : 2/1/4.**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

පර්යේෂණ ආධුනික/පර්යේෂණ නිලධාරී තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආධුනික/පර්යේෂණ නිලධාරී තනතුර සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර හෝ ලේකම්, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය, **315, වොක්ෂෝල් වීදිය, තැ. පෙ. 569, කොළඹ 2 යන** ලිපිනයට ලැබෙනසේ එවිය යුතුයි.

(ඒ) මෙරට ඉල්ලුම් පත් : 1973 අගෝස්තු මස 10 වැනිදා

(බී) පිටරට ඉල්ලුම් පත් : 1973 අගෝස්තු මස 10 වැනිදා

**සංලක්ෂ්‍යය.**—

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන නොලබන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන **පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දිනය** දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩු අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම්පත් ශ්‍රී ලංකාවේ, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි රටට හෝ ඊට ආසන්න තම රටට හෝ පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට කැමති නම් ඔවුන්ට එසේ කළ හැකිය.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා යානපත්‍ර.—ශ්‍රී ලංකාණ්ඩුව යටතේ** සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු විසින් පැවැත්වෙන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණ සඳහා ගාස්තුවත් එසේම ලංකාවට පැමිණීම සඳහා වැයවන යානපත්‍ර, වියදමත් එම නිලධාරීන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි:**—

(i) තනතුරු ස්ථිරය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3ක පරීක්ෂණ කාලයක් මතය.

(ii) පරීක්ෂණ කාලය මත සිටින අවුරුදු 3ක කාලය තුළ පුහුණුවක් ලැබීමටද, තෝරාගනු ලබන අපේක්ෂකයාට සිදුවෙයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කෙරෙන ආකාරයේ විදේශීය පුහුණුවක් හදාරා එමගින් වැඩිමනත් සුදුසුකම් ලබාගැනීමටද ඔහුට/ඇයට සිදුවනු ඇත. පුහුණු කාලය සතුටුදායක ලෙස අවසන් කොට දෙපාර්තමේන්තුව තීරණය කරන ආකාරයේ වැඩිමනත් සුසුදුකම් ලබාගැනීමෙන් පසු ඔහු/ඇය පර්යේෂණ නිලධාරී වශයෙන් සවකීය තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට **හිමි ඒකාබද්ධ වැටුප්** ක්‍රමය මෙසේ ය :—

අවුරුද්දකට රුපියල් 7,440 න් පටන්ගෙන රුපියල් 360 වාර්ෂික වැඩිවීම් 10 කින් හා රුපියල් 480 වාර්ෂික වැඩිවීම් 11 කින්ද යුක්තව රුපියල් 16,320 දක්වා වැඩිවීයයි. (රුපියල් 11,520 සහ රුපියල් 14,880 යන වැටුප් තලයන්ට පෙර ක්‍රියාත්මක වන කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

සටහන :—

(අ) තෝරාගනු ලැබූ අපේක්ෂකයා සවකීය විද්‍යාත්මක කාර්ය ක්ෂේත්‍රය පිළිබඳ නියමිත පශ්චාත් උපාධියක් හෝ උසස් තත්වයේ ඩිප්ලෝමාවක් ලබාගතහොත් විනා ඔහු/ඇය ඉහත සඳහන් වැටුප් පරිමානයෙහි රුපියල් 11,520 වාර්ෂික වැටුප් තලයෙන් ඔබ්බට යාමට සුදුසු නොවේ.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක අදාල විෂයයකින් එම්.එස්.සී හෝ පී.එච්ඩී උපාධියක් ඇති අපේක්ෂකයින් තෝරාගනු ලැබුවහොත් ඉහත දක්වා ඇති වැටුප් මත්‍රය යටතේ වර්ෂයකට රුපියල් 7,800 න් පටන් ගැනීමට ඔවුනු සුදුස්සන් වෙති.

4. **සුසුදුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව,

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවැනි හෝ දෙවැනි පෙළ ගෞරව උපාධියක් දරණ අපේක්ෂකයින් සම්බන්ධයෙන් නම් 1973. 08. 10 දිනට වයස අවුරුද 30ට නොවැඩි විය යුතුය. පිළිගත් විශ්ව විද්‍යාලයක **පශ්චාත් උපාධියක් දරණ** අපේක්ෂකයින් නම් එදිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත අය මෙම වයස් සීමාවන් නොතකා සලකා බලනු ලැබේ.)

(ඇ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ හෝ නැත හොත් පහත දැක්වෙන විෂයයන් අතුරින් ඕනෑම එකක් ප්‍රධාන විෂය වශයෙන් ගෙන ලබාගත් පළමුවැනි හෝ දෙවැනි පෙළ සහිත ගෞරව උපාධියක් දරණ උපාධිධරයෙකු විය යුතුය :—

(අ) උද්භිද විද්‍යාව

(ආ) සත්ව විද්‍යාව

(ඇ) රසායන විද්‍යාව

(ඈ) කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව

නැතහොත්

(ii) පහත දැක්වෙන ඕනෑම ක්ෂෙත්‍රයක් පිළිබඳ විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් තිබිය යුතුය :—

(1) ව්‍යවහාර කීට විද්‍යාව

(2) පැළෑටි රෝග නිධාන විද්‍යාව

(3) පාංශු ශුද්‍රජීව විද්‍යාව

(4) පාංශු විද්‍යාව

(5) උද්‍යාන විද්‍යාව

(6) පැළෑටි අභිජනනය

(7) කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව

(8) ශෂ්‍ය විද්‍යාව

(9) ආහාර ප්‍රතිපාදන විද්‍යාව

නැතහොත්

(iii) අවුරුදු 10 ක සේවයක් ඇත්තාවූද පර්යේෂණ කටයුතු කෙරෙහි උදෙස්ගයක් ඇත්තාවූද, පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳව හෝ පහත දැක්වෙන විෂයන්ගෙන් ඕනෑම එකක් ප්‍රධාන විෂය වශයෙන් ගෙන ලබා ඇති උපාධියක් දරණ දෙපාර්තමේන්තුවේ නියුක්ත නිලධාරියෙකු විය යුතුය :—

(අ) උද්භිද විද්‍යාව

(ආ) සත්ව විද්‍යාව

(ඇ) රසායන විද්‍යාව

(ඈ) කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව

සටහන.—පලපුරුද්දක් සහ/හෝ පශ්චාත් උපාධි සුදුසුකම් ඇති අපේක්ෂකයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලිවලින් කිසිවක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළ විටෙක ඒවා අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කැයවීයන් සඳහා නිකුත් කර ඇති බවුතිස්ම උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහා චාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සංලක්ෂය :

(i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කළ නොහැකිවන අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් සවකීය ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, එම නිලධාරීන් විසින් තම ඉල්ලුම් පත් යැව්වේ කවදාද යන්න ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත කෙලින්ම ලියා දැන්විය යුතුය.

7. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි යැවිය යුත්තේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙතය. ඒවා මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොයැවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති 2ක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මා වෙත දැනුම් දිය යුතුය.

ඒ. ව. එම්. සිල්වා,
ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

1973 ජූලි මස 06 වැනි දින,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය,
315, වොක්ෂෝල් වීදිය, තැ. පෙ. 569,
කොළඹ 2.

## ආදර්ශ අයදුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පර්යේෂණ ආධුනික/පර්යේෂණ නිලධාරි තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දනුම් දිය යුතුය.)

3. (අ) උපන් දිනය :—
වර්ෂය :————, මාසය :————, දිනය :————.
(ආ) ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂ :———, මාස :———, දින :———.

4. ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක්ද? පාරම්පරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචිවූ රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න. (ලියා පදිංචිවූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න.) :————.

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තා ගේ :————.
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
(ඉල්ලුම්කරු උපන්නේ ශ්‍රී ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුය. ඔහු/ඇ උපන්නේ ශ්‍රී ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ආ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද යන බව : ————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(i) සිංහල :————.
(ii) දෙමළ :————.
(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවු. 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ටත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණද?

11. ඔබ යම්කිසි සාපරාධී වරදකට සෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

(ලබාගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය සුසුදුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් :-

(රක්ෂාවට බැඳුන දිනය ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම්.—දැන්වීමෙහි දක්වෙනු විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

(විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

මෙම අයදුම් පතෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් බවත් මම දැන සිටිමි.

.........................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

.........................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

7-645/1—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 2/1/14.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පශු වෛද්‍ය තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර හෝ ලේකම්, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය, 315 වොක්සෝල් වීදිය, තැ. පෙ. 569, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

(ඒ) මෙරට ඉල්ලුම්පත් : 1973 අගෝස්තු මස 10 වැනිදා.

(බී) පිටරට ඉල්ලුම්පත් : 1973 අගෝස්තු මස 10 වැනිදා.

**සංලක්ෂ්‍යය :**

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩු අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම්පත් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, ස්වකීය පදිංචි රටට හෝ ඊට ආසන්නතම රටට හෝ පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට කැමති නම් ඔවුන්ට කළ හැකිය.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා යානපත්‍ර.**—ශ්‍රී ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස පිට රටින් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු විසින් පැවැත්වෙන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණ සඳහා ගාස්තුවත් එසේම ලංකාවට පැමිණීම සඳහා වැයවන යානපත්‍ර වියදමත් එම නිලධාරීන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම් ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3 ක පරීක්ෂණ කාලයක් මතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :

(i) **ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය උපාධිධාරීන් සඳහා වැටුප් ක්‍රමය.**—රුපියල් 6,720 න් පටන්ගෙන වර්ෂයකට රුපියල් 360 වැටුප් වර්ධකයන් 12 ක් හා රුපියල් 480 වැටුප් වර්ධකයන් 5 ක් මඟින් රුපියල් 13,440 දක්වා නැගී.

**සටහන.**—රුපියල් 11,040 ඉක්මවා යාමට පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම හෝ නියමිත දෙපාර්තමේන්තු විභාගයකින් සමත් වීම හෝ විය යුතුය.

(ii) වෙනත් විශ්ව විද්‍යාලවල පශු වෛද්‍ය උපාධිධරයන්ට ආයතන අධ්‍යක්ෂගේ උපදෙස් අනුව වැටුප් ප්‍රමාණය නියම කරනු ලැබේ.

4. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව ;

(ආ) 1973.8.10 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව (දැනටත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාල නොවේ) ;

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිධරයෙකු බව.

5. පහත සඳහන් ලියකියවිලි වලින් කිසිවක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළ විටෙක ඒවා අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (**සැ. යු.**—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සංලක්ෂ්‍යය.**—(i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කළ නොහැකිවන අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ස්වකීය ඉල්ලුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද වුවත්, එම නිලධාරීන් විසින් තම ඉල්ලුම් පත් යැව්වේ කවදාද යන්න ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත කෙළින්ම ලියා දැන්විය යුතුය.

7. ඉල්ලුම්පත්‍ර සහ ඒ සම්බන්ධ අනෙක් ලියවිලි යැවිය යුත්තේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙතය. ඒවා මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති දෙකක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මා වෙත දැනුම් දිය යුතුය.

ඒ. ටී. එම්. සිල්වා,
ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය,
315, වොක්ෂෝල් වීදිය,
තැ. පෙ. 569,
කොළඹ 2,
1973 ජුලි මස 06 වැනි දින.

## ආදර්ශ අයදුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පශු වෛද්‍ය තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය.)

3. (අ) උපන් දිනය :—
වර්ෂය :——, මාසය :——, දිනය :————.
(ආ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට තියම් වයස :—
වර්ෂ :——, මාස :——, දින :————.

4. ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක්ද? පාරම්පරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචි රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න) : ————.

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
(ඉල්ලුම්කරු උපන්නේ ශ්‍රී ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුය. ඔහු/ඇ උපන්නේ ශ්‍රී ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවක්ද යන බව :————.

7. සාමාර්ථ්‍ය ලබා ඇති ඉහලම විභාගය :—
(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණද? :————.

11. ඔබ යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වැරදිකරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.
(ලබාගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ වෘත්තීය සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් :
(රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම්.—දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.
(විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. වෙනත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

මෙම අයදුම් පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

7–645/2—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

### සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව

**සේද කර්මාන්ත ව්‍යාපාරයේ පටනූල් කැටීම පිළිබඳ විශේෂඥ තනතුර**

සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවේ සේද කර්මාන්ත ව්‍යාපාරයේ පටනූල් කැටීම පිළිබඳ විශේෂඥ තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගනු ලබන අයදුම්පත් 1973 අගෝස්තු මස 15 වෙනි දින හෝ එදිනට කලින් හෝ කොළඹ 1, තැ. පෙ. 1652, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

**සටහන :**

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින කීපය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අපේක්ෂකයන් විසින් ම විඳ දරා ගත යුතුය.

**2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් රහිත ය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයෝ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත් කරනු ලබත්.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවෙකු 1972 ජනවාරි 1 වන දිනට පෙර රජය යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් දරන්නකු නම්, ඔහු පළමු කොට නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය. වර්ෂයකට රු. 7,440—10×360 හා 11×480—16,320 (රු. 11,520 හා රු. 14,880 පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

**සටහන :**

(i) නියමිත පශ්චාත් උපාධියකින් සමත් නොවුවහොත්, වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 11,520 වැටුප් පියවරින් ඔබ්බට යාමට කිසිම නිලධාරියෙකුට හිමිකමක් නැත.

(ii) නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරණ අයදුම්කරුවෙකු ඉහත වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 8,520 වැටුප් පියවරේ තබනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පෝෂකාර්මික විද්‍යාව පිළිබඳ උපාධියක්,

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතික විද්‍යාව පිළිබඳ පළමුවැනි හෝ දෙවැනි පන්තියේ උපාධියක්,

හෝ

(ඇ) භෞතික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක්,

හෝ

(ඈ) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ඒ. එම්. අයි. එම්. ඊ. සහතිකයක් තිබිය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන් අවුරුදු 22 ට නොඅඩු, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. පශ්චාත් උපාධිධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස අවුරුදු 35 ක් වේ. (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙම වයස් සීමා බල නොපාන්නේ වේ.)

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියකියවිලිවලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

**සැලකිය යුතුයි.**—බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාර ගනු නොලැබේ.

(ආ) උපාධි සහතික හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් ; මෙයින් එකක් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන :**

(1) අයදුම්පත්විලට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.

(2) ඉල්වූ අවස්ථාවක දී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මගින් එවිය යුතුය.

7. අයදුම් පත්‍ර, ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 ජූලි මස 9 වැනි දින,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ. පෙ. 1652,
කොළඹ 1.

### ආදර්ශ අයදුම් පත්‍රය

සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවේ සේද කර්මාන්ත ව්‍යාපාරයේ පටනූල් කැටීම පිළිබඳ විශේෂඥ තනතුර සඳහා අයදුම් පත්‍රය **(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.)**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :——, මාසය :——, දිනය :————.

(ආ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

වර්ෂ :——, මාසය :——, දින :——.

4. ඔබ ලංකා රට වැසියෙක් ද? පාරම්පරික රට වැසියෙක් ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න) :————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහක ද? අවිවාහක ද? වැන්දඹුවක් ද යන බව : ————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. .................. | .......... | .......... | 1. .................. | .......... | .......... |
| 2. .................. | .......... | .......... | 2. .................. | .......... | .......... |
| 3. .................. | .......... | .......... | 3. .................. | .......... | .......... |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද? :————.

10. ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම්. (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබා ගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.

12. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන්. (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.) :————.

| | පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|---|
| (1) | ........................ | ........ | ........ | ........ |
| (2) | ........................ | ........ | ........ | ........ |
| (3) | ........................ | ........ | ........ | ........ |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—

(1) ————.

(2) ————.

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගතහොත්, මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–665—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව උප දිසාපති කොට්ඨාශයේ නිකවැහැර-මඩහපොළ කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව උප දිසාපති කොට්ඨාශයේ නිකවැහැර-මඩහපොල කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973.08.10 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපියනට ලැබෙන සේ එවිය යුතුයි :—

“ දිසාපති, කච්චේරිය, කුරුණෑගල. ”

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කොට්ඨාශයක ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපැලෙන් එවිය යුතු වේ.

7. නිකවැහැර කොට්ඨාශය මකුල්පොත, නිකවැහැර, හෙනව, දිද්දෙනිය, කිඹුල්වාණාඔය ග්‍රාමසේවක වසම්වලටද, මඩහපොල කොට්ඨාශය කැරලංකඩවල, මඩහපොල, මඩහපොළකන්ද, දියතුර, ගුරුස්ස යන ග්‍රාමසේවක වසම්වලටද සීමාවනු ඇත.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973 ක්වූ ජූලි මස 05 දා,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව උප දිසාපති කොට්ඨාශයේ නිකවැහැර-මඩහපොළ කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

13. පදිංචි ග්‍රාමසේවක වසම :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–655—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය උප දිසාපති කොට්ඨාශයේ මයුරාවතී කෝරළයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධුරය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය උප දිසාපති කොට්ඨාශයේ මයුරාවතී කෝරළයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973. 08. 10 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නො අඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කෝරළයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973. 07. 05 දා,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය උප දිසාපති කොට්ඨාශයේ මයුරාවතී කෝරළයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :——— ——.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7 දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7–656—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහරච්චිමුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පරණගම-දඹදෙණිය කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහරච්චිමුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පරණගම-දඹදෙණිය හදිසි මරණ පරීක්ෂක ධුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973. 08. 10 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කොට්ඨාශයක ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත්වී සිටීම

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ.

7. පරණගම කොට්ඨාශය පරණගම, අතුරුවැල, රිලිගල යන ග්‍රාම සේවක වසම්වලටද, දඹදෙණිය කොට්ඨාශය දඹදෙණිය, මාරාවිට, මැටියගනේ යන ග්‍රාමසේවක වසම්වලටද සීමාවනු ඇත.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973 ජූලි මස 05 ද,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහරච්චිමුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පරණගම-දඹදෙණිය කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

13. පදිංචි ග්‍රාමසේවක වසම :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–653—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව උප දිසාපති කොට්ඨාශයේ මාළිය-හත්පොකුණ කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව උප දිසාපති කොට්ඨාශයේ මාළිය-හත්පොකුණ කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973. 08. 10 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතලක්ෂණ හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කොට්ඨාශයක ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ.

7. **මාළිය කොට්ඨාශය** පොත්නිලව, දෙරවේරුව, මාළිය, බල ගොල්ල යන ග්‍රාමසේවක වසම්වලටද, **හත්පොකුණ කොට්ඨාශය** ගල්වැන්වැව, හත්පොකුණ, කුඹුකුලාව, හාතිගමුව යන වසම්වලටද සීමාවනු ඇත.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973 ජූලි මස 05 දි,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව උප දිසාපති කොට්ඨාශයේ මාළිය-හත්පොකුණ කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

13. පදිංචි ග්‍රාමසේවක කොට්ඨාශය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-654 — 73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**"කුඩාපාඩුව" 'බී' ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධුරය**

මීගමුව මහා නගර සභා සීමාවේ පිහිටුවීමට යන 'කුඩාපාඩුව' 'බී' ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපතිවරයෙක් පත් කිරීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම තනතුර සඳහා ගෙවන අඩුම මාසික දීමනාව රු. 50 කි.

2. 1973.08.31 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයම වයස අවුරුදු 21 ට වැඩි සහ අවු. 45 ට අඩු ලාංකිකයින් විය යුතු යි.

3. ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සභා ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය. උප තැපැල් කාර්යාලය පිහිටුවන නගර සභා කොට්ඨාශය තුළ සහ යාබද කොට්ඨාශ වල පදිංචි අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංකගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංකගණිතය/උසස් ගණිතය/ව්‍යවහාර ගණිතය/ගණකාධිකරණය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත්වී සිටිය යුතු ය.

5. කුඩාපාඩුව උප තැපැල් කාර්යාලය පවත්වා ගෙන යාම සුදුසු ගොඩනැගිල්ලක් කුලී රහිතව ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

6. කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ, අංක 5 දරණ ගොඩ නැගිල්ලේ පිහිටි (කොළඹ/උතුර) කොට්ඨාශයේ, ප්‍රාදේශීය තැපැල් අධිකාරීතුමාගෙන් ඉල්ලුම් පත් සඳහා මුද්‍රිත පෝර්ම ලබා ගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1973. 08. 31 වැනි දින හෝ ඊට පෙර හෝ ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

7. වැඩිදුරටත් විස්තර අවශ්‍ය නම්, ප්‍රාදේශීය තැපැල් අධිකාරීතුමා ගෙන් ලබා ගත හැක.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලිසංදේශ අධ්‍යක්ෂ.

7-650 — 73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

අධ්‍යාපන අමාත්‍යාංශය

රජයේ සිංහල මාධ්‍යය පාසල්වල වාණිජ විද්‍යාව ඉගැන්වීම සඳහා දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සහතික පත්‍ර නො ලත් උපගුරුවරුන් බඳවා ගැනීම

රජයේ සිංහල මාධ්‍ය පාසල්වල සහතික පත්‍ර නොලත් වාණිජ විද්‍යා උපගුරු තනතුරු සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ ඊට සමාන සුදුසුකම් ලත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත්‍ර පිළියෙල කොට 1973 අගෝස්තු මස 10 වැනි දින හෝ ඊට පෙර මෙම නිවේදනයේ 5 (ඇ) ඡෙදය අනුව තමා පදිංචි ඡන්ද කොට්ඨාශය අයත් අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'සහතික නොලත් වාණිජ විද්‍යා උපගුරු තනතුර' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

2. ඒ ඒ ඡන්ද කොට්ඨාශය අයත් අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගේ ලිපිනයන් පහත දක්වේ :—

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | ඡන්ද කොට්ඨාශය | අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර නිලධාරියාගේ ලිපිනය |
|---|---|---|
| කොළඹ දකුණ | 1. දෙහිවල-ගල්කිස්ස<br>2. කොලොන්නාව<br>3. කෝට්ටේ<br>4. මොරටුව | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ග්‍රීන්පාත්, කොළඹ 7 |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | ඡන්ද කොට්ඨාශය | අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර නිලධාරියාගේ ලිපිනය |
|---|---|---|
| | 5. මැද කොළඹ<br>6. උතුරු කොළඹ<br>7. බොරැල්ල<br>8. දකුණු කොළඹ | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ග්‍රීන්පාත්, කොළඹ 7. |
| හෝමාගම ... | 1. අවිස්සාවේල්ල<br>2. හෝමාගම<br>3. කැස්බෑව<br>4. කොට්ටාව | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, හෝමාගම |
| ගම්පහ ... | 1. අත්තනගල්ල<br>2. වත්තල<br>3. මීගමුව<br>4. කටාන<br>5. දිවුලපිටිය<br>6. මීරිගම<br>7. මිනුවන්ගොඩ<br>8. ගම්පහ<br>9. ජා-ඇල<br>10. දෙම්පෙ<br>11. මහර<br>12. කැළණිය | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගම්පහ |
| කළුතර ... | 1. කළුතර<br>2. අගලවත්ත<br>3. බණ්ඩාරගම<br>4. බේරුවල<br>5. බුලත්සිංහල<br>6. හොරණ<br>7. පානදුර<br>8. මතුගම | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කළුතර |
| ගාල්ල ... | 1. ගාල්ල<br>2. බෙන්තර-ඇල්පිටිය<br>3. බලපිටිය<br>4. අම්බලන්ගොඩ<br>5. රත්ගම<br>6. බද්දේගම<br>7. හිනිදුම<br>8. අක්මීමන<br>9. හබරාදූව | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගාල්ල |
| මාතර ... | 1. මාතර<br>2. වැලිගම<br>3. කඹුරුපිටිය<br>4. හක්මන<br>5. අකුරැස්ස<br>6. දෙනියාය<br>7. දෙවිනුවර | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ. අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මාතර |
| තංගල්ල ... | 1. තිස්සමහාරාමය<br>2. මුල්ගිරිගල<br>3. බෙලිඅත්ත | ... ප්‍රධාන අධ්‍යාපන නිල-ධාරි, අධ්‍යාපන කාර්යාලය, තංගල්ල |
| රත්නපුර ... | 1. රත්නපුර<br>2. පැල්මඩුල්ල<br>3. බලංගොඩ<br>4. රක්වාන<br>5. නිවිතිගල<br>6. කලවාන<br>7. කිරිඇල්ල<br>8. කොලොන්න | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, රත්නපුර |
| කෑගල්ල ... | 1. කෑගල්ල<br>2. දැදිගම<br>3. ගලිගමුව<br>4. මාවනැල්ල<br>5. යටියන්තොට<br>6. රුවන්වැල්ල<br>7. දෙහිඕවිට<br>8. රඹුක්කන | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කෑගල්ල |
| මහනුවර ... | 1. මහනුවර<br>2. වත්තේගම<br>3. අකුරණ<br>4. උඩුනුවර<br>5. ගලගෙදර<br>6. සෙංකඩගල<br>7. කුණ්ඩසාලේ<br>8. තෙල්දෙණිය<br>9. යටිනුවර<br>10. හේවාහැට<br>11. ගම්පොල<br>12. නාවලපිටිය<br>13. මිනිපේ<br>14. හඟුරන්කෙත | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මහනුවර |
| මාතලේ ... | 1. මාතලේ<br>2. දඹුල්ල<br>3. ලග්ගල<br>4. රත්තොට | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරි, අධ්‍යාපන කාර්යාලය, මාතලේ |
| නුවරඑළිය ... | 1. නුවරඑළිය<br>2. මස්කෙළිය<br>3. කොත්මලේ<br>4. වලපනේ<br>5. ඌව-පරණගම<br>6. වැලිමඩ | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නුවරඑළිය |
| බණ්ඩාරවෙල ... | 1. බණ්ඩාරවෙල<br>2. මහියංගනය<br>3. බදුල්ල<br>4. පස්සර<br>5. සොරණාතොට<br>6. හපුතලේ | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල |
| මොණරාගල ... | 1. මොණරාගල<br>2. බිබිල | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරි, අධ්‍යාපන කාර්යාලය, මොණරාගල |
| හලාවත ... | 1. හලාවත<br>2. නිකවැරටිය<br>3. බිංගිරිය<br>4. පුත්තලම<br>5. නාත්තන්ඩිය<br>6. වෙන්නප්පුව | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, හලාවත |
| කුරුණෑගල ... | 1. කුරුණෑගල<br>2. යාපහුව<br>3. හිරියාල<br>4. වාරියපොල<br>5. කටුගම්පොල<br>6. කුලියාපිටිය<br>7. දඹදෙනිය<br>8. පොල්ගහවෙල<br>9. මාවතගම<br>10. දෙඩම්ගස්ලන්ද | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කුරුණෑගල |
| අනුරාධපුරය ... | 1. අනුරාධපුරය<br>2. මැදවච්චිය<br>3. හොරොව්පතාන<br>4. කැකිරාව<br>5. කලාවැව<br>6. මිහින්තලේ | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුරය |
| පොලොන්නරුව... | 1. පොලොන්නරුව<br>2. මින්නේරිය | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය,. පොලොන්නරුව |
| යාපනය ... | 1. යාපනය<br>2. කයිට්ස්<br>3. උඩුප්පිඩි<br>4. නල්ලූර්<br>5. කන්කසන්තුරේ<br>6. කිලිනොච්චි | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, යාපනය |

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | ඡන්ද කොට්ඨාශය | අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර නිලධාරියාගේ ලිපිනය |
|---|---|---|
| | 7. වාවංකච්චේරි<br>8. පේදුරුතුඩුව<br>9. වඩ්ඩුකොඩ්ඩෙයි<br>10. උඩුවිල්<br>11. කෝප්පායි | ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, යාපනය |
| වවුනියා | ... 1. වවුනියා | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, වවුනියාව . |
| මන්නාරම | ... 1. මන්නාරම | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මන්නාරම |
| මඩකලපුව | ... 1. මඩකලපුව<br>2. පදීරිප්පුව<br>3. කල්කුඩා | ... ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මඩකලපුව |
| අම්පාරේ | ... 1. අම්පාරේ | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, අම්පාර |
| කල්මුනේ | ... 1. කල්මුනේ<br>2. නිත්තවූර්<br>3. පොතුවිල් | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, කල්මුනේ |
| ත්‍රිකුණාමලය | ... 1. ත්‍රිකුණාමලය<br>2. මුත්තූර් | ... ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, ත්‍රිකුණාමලය |

**3. සේවයේ යෙදීමේ නියමයන් හා සේවා කොන්දේසි :**

(අ) (i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය.

(ii) පත් කරනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) පරීක්ෂණ කාලය අවුරුදු තුනකි.

(iv) පත්වීමක් ලබන්නා විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවේ යෙදවීම සඳහා ද සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ද ක්‍රියා කළ යුතුය.

(v) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි පරිපාලන හා ආයතන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධානයන් රෙගුලාසි යන රජය විසින් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

(ආ) පත්කිරීම සඳහා තෝරා ගනු ලැබූවන් විසින් තමා පත්කරනු ලැබූ අධ්‍යාපන දිස්ත්‍රික්කයේ, පාසල් අතුරින් නියම කරන ලද පාසලක සේවය කළයුතු අතර, මොනම හේතුවක් නිසාවත් එම දිස්ත්‍රික්කයෙන් බැහැරට ස්ථාන මාරුවක් සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් නොමැත. එහෙත් විනයානුකූල හේතූන් හා දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් නිසා ස්ථාන මාරුවීම් කිරීමට දෙපාර්තමේන්තුවට ඇති අයිතිවාසිකමට මෙයින් අවහිරයක් නොවනු ඇත.

**4. මෙම තනතුරු සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේය :**

(i) **ඒකාබද්ධ වැටුප : වර්ෂයකට—රු. 2,700—21 × 60—3,960. (රු. 2,880ට හා රු. 3,360ට පෙර කාර්යක්ෂමතා කඩඉම්)**

(ii) **කල්පිත වැටුප : වර්ෂයකට—රු. 792—21 × 42—රු. 1,674. (රු. 918ට හා රු. 1,254ට පෙර කාර්යක්ෂමතා කඩඉම්)**

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇ පහත සඳහන් කරුණු වලින් යුක්ත වන බවට සෑහීමකට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(අ) විශිෂ්ට චරිතයකින් හා ඉතා ශාරීරික ශක්තිමත් තත්ත්වයකින් ද යුක්තව සිටින බව.

(ආ) 1973.08.10 දිනට වයස අවුරුදු 18ට අඩු හෝ අවුරුදු 35ට වැඩි හෝ නොවන බව.

(ඇ) පහත සඳහන් සුදුසුකම් හෝ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය :—

(අ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් ගෙන් යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින්වත් සාමාර්ථය ලබා තිබීම :—

(1) වාණිජ්‍ය හා මුදල්
(2) ගණකාධිකරණය
(3) අර්ථ ශාස්ත්‍රය

සහ

සිංහල (භාෂාව හෝ සාහිත්‍යය) සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය සාමාර්ථය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ලබා තිබීම. (යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන් දෙකකටවත් සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය.)

(i) වාණිජ අංක ගණිතය හෝ ගණිතය
(ii) ගණකාධිකරණය
(iii) වාණිජ්‍යය
(iv) ආර්ථික විද්‍යාව
(v) ලඝුලේඛනය හා යතුරු ලියනය. (ලඝුලේඛනය හා යතුරු ලියනය එක් විෂයයක් හැටියට ගණන් ගනු ලැබේ.)

හෝ

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් ගෙන් යටත් පිරිසෙයින්, විෂයයන් දෙකකින්වත් සාමාර්ථය ලබා තිබීම :—

(1) වාණිජ්‍යය හා මුදල්
(2) ගණකාධිකරණය
(3) අර්ථ ශාස්ත්‍රය

සහ

සිංහල (භාෂාව හෝ සාහිත්‍යය) සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය ට සාමාර්ථය සහිතව අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙ.) සහතික පත්‍රය ලබා තිබීම. (යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන්ගෙන් දෙකකට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය.)

(i) වාණිජ අංක ගණිතය හෝ ගණිතය
(ii) ගණකාධිකරණය
(iii) වාණිජ්‍යය
(iv) ආර්ථික විද්‍යාව
(v) ලඝුලේඛනය හා යතුරු ලියනය. (ලඝුලේඛනය හා යතුරු ලියනය එක් විෂයයක් හැටියට ගණන් ගනු ලැබේ.)

(ඈ) තමන් පදිංචිය දක්වා ඇති ඡන්ද කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවෙකු බව පහත සඳහන් කුමන හෝ එක් ආකාරයකින් ඔප්පු කිරීමට අයදුම්කරු සමත් විය යුතුය ;—

(i) ඡන්ද කොට්ඨාශයේ උපන් බව (උප්පැන්න සහතිකය මගින්.)

(ii) ඡන්ද කොට්ඨාශයේ පිහිටි පාසලකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයට හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් වූ බව. (ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ අ.පො.ස. සාමාන්‍ය සහතිකය මගින්.)

(iii) ඡන්ද කොට්ඨාශයේ ලියාපදිංචි ඡන්දදායකයකු බව. (ඡන්දදායක ලේඛනයක සහතික කළ උධෘතයක් මගින්.)

(iv) අයදුම්කරුගේ දෙමාපියන් ඡන්ද කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවන් වීමත් සමඟ පසුගිය අවුරුදු 3 ඇතුලත ස්ථිර පදිංචිකරුවෙකු බව (ග්‍රාම මූලික ලැයිස්තු මගින්.)

(ඉ) අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්.

**සටහන.**—ඉහත සඳහන් ලියවිලිවල පිටපත් අමුනා එවීමට අපොහොසත් අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ඉල්ලුම් පත්‍ර සහ අනිකුත් අදළ ලියකියවිලි මෙම නිවේදනයේ 1 වැනි ඡෙදයේ පරිදි එවිය යුතු අතර, අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවල කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතු ය.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවන ඡෙදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් පොදු කොන්දේසි බලනු මැනවි.

8. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නො ලැබේ.

9. තැපෑලේ දී සිදුවිය හැකි කවර ප්‍රමාදයක් හෝ මඟහැරවීම සඳහා සිය ඉල්ලුම්පත් කල්වේලා ඇතිව ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම්කරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. උඩුගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජූලි මස 10 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දිය.

රජයේ පාසල්වල වාණිජ විද්‍යාව ඉගැන්වීම සඳහා දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සහතික පත්‍ර නොලත් උපගුරු තනතුරු

ඉල්ලුම් කරන අධ්‍යාපන දිස්ත්‍රික්කය :———

1. මුලට පෙලපත් නාමය සහිත සම්පූර්ණ නම : ———.
(පැහැදිලි අකුරෙන්)

2. (i) ස්ථිර ලිපිනය : ———.
(ii) ඡන්ද කොට්ඨාශය : ———.

3. ස්ථිර වශයෙන්ම අයත් ඡන්දදායක කොට්ඨාශය : ———.
(ගැසට් නිවේදනයේ 5(ඇ) ඡෙදය අනුව)

4. ස්ත්‍රී/පුරුෂ භාවය : ———.

5. ඉල්ලුම්කරු අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයට ඉදිරිපත්වූ පාසල : ———

6. විවාහක ද අවිවාහක ද යන බව : ———.

7. උපන් දිනය හා ස්ථානය : ———.

8. 1973.08.10 දිනට වයස : ———.

9. (i) අයදුම් කරුගේ පියා උපන් ස්ථානය : ———.
(ii) අයදුම්කරුගේ මව උපන් ස්ථානය : ———.

10. ජාතිය : ———.

11. ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන බව : ———.

12. සුදුසුකම් :

(1) ජ්‍යෙ.පා.ස./අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :

| | වර්ෂය හා මාසය | විභාග අංකය | විෂයයන් | ලබා ඇති සාමාර්ථය (අදල කොටසේ "√" සළකුණ යොදන්න) | | | කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|
| | | | | විශිෂ්ඨ | සම්මාන | සාමාන්‍ය | |
| පළමුවර : | | | (1)<br>(2)<br>(3)<br>(4)<br>(5)<br>(6)<br>(7)<br>(8) | | | | |
| දෙවනවර : | | | (1)<br>(2)<br>(3)<br>(4)<br>(5)<br>(6)<br>(7)<br>(8) | | | | |

(2) අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

| වර්ෂය හා මාසය | විභාග අංකය | විෂයයන් | සමත්විද අසමත්විද යන්න සඳහන් කරන්න | සමත්වූයේ නම් ලබා ඇති සාමාර්ථය (අදල කොටුවේ "√" සළකුණ යොදන්න) | | | කාර්යාලිය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|
| | | | | විශිෂ්ඨ | සම්මාන | සාමාන්‍ය | |
| | | (1)<br>(2)<br>(3)<br>(4) | | | | | |

(3) වෙනත් අධ්‍යාපන සුදුසුකම් (ඇත්නම් සඳහන් කරන්න) : ———.

13. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඒ සම්බන්ධ විස්තර පහත සපයන්න :—

(1) දෙපාර්තමේන්තුවේ නම : ————.

(2) දරණ ලද තනතුර සහ එම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ද යන බව : ————.

(3) පත් වූ දිනය : ————

(4) අස් වූ දිනය සහ අස්වීමට හේතු : ————.

(5) ගුරුවරයෙක් නම්, ලියාපදිංචි කිරීමේ අංකය සහ අන්තිමට සේවය කළ පාසල : ————.

14. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර : ————.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පික විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය උඩ සේවයෙන් විශ්‍රාම ගන්වා නොමැති බවත් තනතුර අතහැර ගිය අයෙකු සේ සළකා නැති බවත්, මා පරම්පරාවෙන්/ලියාපදිංචි කිරීමෙන් ලාංකිකයෙකු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරාගැනීමට කලින් හෙලිවුවහොත් මා නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, පත්කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි.)

————. ගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි ය.

————,
දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා හෝ
ඒ වෙනුවට බලය ලත් නිලධාරියාගේ අත්සන.

තනතුර : ————.

ලිපිනය : ————.

දිනය : ————.

7-758—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආරෝග්‍යශාලා ලිපිකාර සේවයේ II වන පංතියේ 'අ' ඛණ්ඩයට පත්කිරීමේ විභාගය—1972 නොවැම්බර්

ආරෝග්‍ය ශාලා ලිපිකාර සේවයේ අභිනව ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ 1972.3.24 දින සහ අංක 813 දරණ වි. කො. චක්‍ර ලේඛය අනුව, 1972.11.25දින පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයින් කුසලතාවයේ අනු පිළිවෙලට 1972.11.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආරෝග්‍යශාලා ලිපිකාර සේවයේ II වන පංතියේ 'අ' ඛණ්ඩයට පත්කිරීම සඳහා තෝරාගෙන ඇති බව මෙයින් දනුම් දෙමි.

| අංකය | | නම | | සේවය කරන ස්ථානය |
|---|---|---|---|---|
| 1 | ... | ජයතිලක, යු. ඩී. මහතා | ... | මහ රෝහල, මහනුවර |
| 2 | ... | සේනානායක, එම්. කේ. මෙමෙනවිය | | ද සොයිසා කාන්තා රෝහල, කොළඹ |
| 3 | ... | ලයනල්, එන්. ඊ. මහතා | ... | කො. රෝ. ම. අධිකාරි, කාර්යාලය, කොළඹ |
| 4 | ... | ප්‍රේමරත්න, එච්. පී. මහතා | ... | දකුණ කොළඹ මහ රෝහල, කළුබෝවිල |
| 5 | ... | ලියනගේ එච්. ඒ. මහතා | ... | මහ රෝහල, කොළඹ |
| 6 | ... | කුරුප්පු, ඩී. ජේ. මහතා | ... | මුල්ලේරියාව මානසික රෝහල, අංගොඩ |
| 7 | ... | ප්‍රනාන්දු, ඩබ්ලිව්. බී. ජේ. මහතා | | මානසික රෝහල, අංගොඩ |
| 8 | ... | නාමසේන, යු. ඩී. මහතා | ... | සෞ. සේ. අධි. කාර්යාලය, කෑගල්ල |
| 9 | ... | ප්‍රේමදාස, එච්. කේ. එම්. මහතා | ... | ක්ෂය රෝග මර්ධන ව්‍යා. අධි. කාර්යාලය, කොළඹ |
| 10 | ... | පෙරේරා, එම්. බී. මහතා | ... | වෛද්‍ය පර්යේෂනා ආයතනය, කොළඹ 8 |
| 11 | ... | පෙරේරා, ඇම්. ජේ. මහතා | ... | මහ රෝහල, මහනුවර |
| 12 | ... | අබේරත්න බණ්ඩා, ඒ. ආර්. මහතා | | දිසා රෝහල, තෙල්දෙනිය |
| 13 | ... | වික්‍රමරත්න, එන්. මහතා | ... | කො. රෝ. ම. අධි. කාර්යාලය, කොළඹ |
| 14 | ... | කරුණාරත්න, ටී. මහතා | ... | මහ රෝහල, මහනුවර |
| 15 | ... | රත්නපාල, එච්. එල්. මහතා | ... | කො. රෝ. ම. අධි. කාර්යාලය, කොළඹ |
| 16 | ... | ප්‍රේමදාස, ජේ. ඒ. මහතා | ... | රජයේ රෝහල, මාතර |
| 17 | ... | සෝමදාස එස්. කේ. යු. මහතා | ... | මහ රෝහල, කොළඹ |

ජී. අමරසේන,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට,

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
කොළඹ, 1973 ජුලි මස 9 දින.

7-652—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

අංකය : 1/23/4/17 (ජී).

## සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1973 සැප්තැම්බර්

1971.9.29 වැනි දින හා අංක 14,977/9 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද සාමාන්‍ය ලිපිකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 15 වැනි වගන්තියේ සඳහන් පරිදි සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ 'අ' ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වූ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් විසින් 1973 සැප්තැම්බර් මස 29 වැනි දින, කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**2. විභාග පරිපාටිය.**—විභාගය සඳහා පහත සඳහන් විෂයයන් ඇතුළත් වේ :—

(i) කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය

(ii) රජයේ කාර්යාලවල යොදා ඇති ගිණුම් ක්‍රමය.

**නිර්දේශ පත්‍රිකාව.**—පහත සඳහන් ඒවා ගැන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් දැන සිටීම අපේක්ෂා කරනු ලැබේ :—

1. කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය (පැය දෙකක ප්‍රශ්න පත්‍රයකි.)

(i) කාර්යාල ක්‍රමවල වැදගත්කම ;

(ii) කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම ;

යත පරිදි, ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජෙනරාල් විසින් නිකුත් කරනු ලැබූ හැඳින්වීමේ පත්‍රිකාවක්.

(ආ) විභාගය පටන් ගන්නා දිනයට අවුරුදු තුනකට වඩා පැරණි නොවූ පාස්පෝට් බලපත්‍රයක්.

(ඇ) විභාගය පටන් ගන්නා දිනයට අවුරුදු තුනකට වඩා ඉහත නොවූ දිනයක, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක නියමය පිට නිකුත් කරනු ලැබුවාවූද, අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ඡායාරූපය දරන්නා වූද, බලපත්‍රයක් හෝ සහතික පත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක් (අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන එහි පසු පිටේ යොදා එම අත්සන සහ පසුපිටේ ඡායාරූපය අයදුම්කරුගේම/අයදුම්කාරියගේම බව දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියකු හෝ සහතික කළ යුතුය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනය එහි සඳහන් කළ යුතුය. මෙම ඡායාරූප පිටපත විභාග ශාලාධිපති විසින් රඳවා ගන්නවා ඇත.)

9. විභාග පැවැත්වීම සම්බන්ධයෙන්, විභාග කොමසාරිස් විසින් පනවන ලද නීති රීතිවලට විභාගාපේක්ෂකයන් යටත් වන අතර, මෙම නීති උල්ලංඝනය කළහොත් ඔහු විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුන්ට සිදු වෙනවා ඇත.

අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් සඳහා පනවා ඇති නීති රීති මේ නිවේදනය අග වෙනම මුද්‍රණය කර ඇත.

10. ඉහත 6 වැනි ඡේදයේ දක්වා ඇති නියමයන් පිළිපැදීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගෙන්/අපේක්ෂිකාවන්ගෙන් පසුව ලැබෙන ලියුම් කියුම් භාර ගනු නොලැබේ.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් සහ වැඩබලන රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
1973 ජූලි මස 9 වැනි දින.

### ඉල්ලුම් පත්‍රය

**සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ 'අ' ඛණ්ඩයේ නිලධාරීන් සඳහාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1973 සැප්තැම්බර්**

(සැලකිය යුතුයි.—මෙම ආකෘති පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරවිය යුතුය.)

| |
|---|
| විභාග අංකය :— (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.) |

1. (i) ඔබගේ අගට යෙදෙන නම මුලකුරු සමග :————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
   (පැහැදිලිව ලියන්න)
   (ii) ස්ත්‍රී පුරුෂ භාවය :————.

2. ඔබ රජයේ සේවයට ඇතුළත් වූවාට පසු ඔබේ නම වෙනස් කර තිබේද ? එසේ නම් මුල් නම සඳහන් කරන්න : ————.

3. උපන් දිනය :————.

4. (i) සාමාන්‍ය ලිපිකාර සේවයේ වි. ලි. ප. II වැනි ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :————.
   (ii) සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ 'අ' ඛණ්ඩයට ඇතුළත් වූ දිනය :————.

5. ඔබ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදී ප්‍රවේශකයෙක් ද නැතහොත් නව ප්‍රවේශකයෙක් ද :————.

6. දෙපාර්තමේන්තුවේ නම :————.

7. කාර්යාලයීය ලිපිනය :————.

8. ඔබ මින්. ඉහත විභාගයකදී පහත සඳහන් විෂයයන් එකකින් හෝ සමත් වී තිබේද ? ගිණුම් ; සිංහල (ඒ), (බී), පහළ සිංහල (ඒ), (බී) ; දෙමළ (ඒ), (බී) පහල දෙමළ (ඒ), (බී) ; කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය ; එසේ නම් විෂය සහ විභාග දිනය සඳහන් කරන්න :————.

9. 1965 දෙසැම්බර් 7 වැනි දින අංක (ජී) 98 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ විධිවිධානවලට අනුව ඔබ සිංහල/දෙමළ විෂයයෙන් නිදහස් කර ඇත්නම්, එසේ නිදහස් කරන ලද භාණ්ඩාගාර හෝ රාජ්‍ය පරිපාලන ලිපියොමුව සඳහන් කරන්න :————.

10. ඔබ දැන් ඉදිරිපත් වන විෂය/විෂයයන් :—
    (අ) :————.
    (ආ) :————.

11. ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :————.

12. (i) ඔබ මෙම විභාගයට පළමුවරට පෙනී සිටින්නේ
    (අ) විෂයයන් දෙකම සඳහා ද ? :————.
    (ආ) කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය සඳහා පමණක්ද ? : ————.
    (ඇ) ගිණුම් ක්‍රම සඳහා පමණක් ද ?————.
    යන වග සඳහන් කරන්න.
    (ii) ඔබ මෙම විභාගය පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් රු. 15/රු. 7.50 ක් වටිනා මුද්දර අලවා ඇත් ද :—

13. මුද්දර කොටුව :—

| |
|---|
| රු. 7.50 හෝ<br>රු. 15 අදාළ පරිදි, |

**සංලක්ෂය** :—අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් අදාළ පරිදි රු. 15/රු. 7.50 වටිනා මුද්දර අලවා ඔහුගේ/ඇගේ අත්සන සහ දිනය යොදා මෙම මුද්දර අවලංගු කළ යුතුය. මුද්දර එකපිට එක නොඇලවිය යුතු යි.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත II වැනි ඡේදයෙන් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙහි අලවා ඇති රු. ............ ක මුද්දර පාවිච්චි නොකරන ලද වලංගු ඒවා බවත් සහතික කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිපැදීමට ද මම එකඟ වෙමි.

............................................
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.
(පහත දැක්වෙන සටහන බලන්න.)

දිනය :————.

**සටහන.**—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු හෝ තමාගේ ප්‍රාදේශීය ප්‍රධානයා හෝ ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

### අත්සන සහතික කිරීම

මගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියකු සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .............. මහතා/මහත්මිය/මෙනෙවිය ...................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත්* රු. 15 ක්/රු. 7.50 ක්* වටිනා මුද්දර මෙම ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවත්,

(iii) අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :————.

දිනය :————.

* අදාළ නොවන දෑ කපා හරින්න.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස් යකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍යසේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

### නීති

සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවනතුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාමද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරණ ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ යනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබාගත යුතුයි.

6. විභාගාපේක්ෂකයාගේ උත්තර පත්‍රය හඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක කිසිවක් නොලිය යුතුය. මෙම නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිළි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචාසහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවෙන් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කෑබලි ද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, පයිල් කවර, කාඩ් බෝඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබාගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ වේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ලෙහා හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවකු

හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිට වී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතින්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන පිටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

### විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිය වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට වත් කලින් විභාගශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළ හොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පෙවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාවම විභාගශාලාධිපතින්ට දැන්විය යුතුය. විභාගශාලාවේදී ඔබටම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේත් ප්‍රශ්නවලට අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්නද තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුය. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැක්ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණන බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිවද සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරු වලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතිට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුයි. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විටද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

7-590 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## 1974 වර්ෂයේ දී රජයේ පාසල්වල 1 වැනි ශ්‍රේණියට ළමයින් ඇතුළු කිරීම

1974 ජනවාරි මාසයේ දී රජයේ පාසල්වල 1 වැනි ශ්‍රේණියට භාරගනු ලබන ළමයින් 1974 ජනවාරි මස 31 වැනි දිනට වයස අවුරුදු 6 සම්පූර්ණ කරන්නන් විය යුතුයි. එනම් 1968.01.31 හෝ ඊට පෙර උපන් අය විය යුතුය.

2. මේ ශ්‍රේණිය සඳහා ඇතුළු කිරීමේ විභාගයක් නොපැවැත්වේ.

3. ළමයින් තෝරා ගැනීමේ පදනම වන්නේ පාසැලේ සිට දෙමාපියන් පදිංචි ස්ථානයට ඇති ආසන්නතාවයි.

4. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කරගත් ඉල්ලුම් පත් දෙමාපියන් පදිංචි ස්ථානයට ඉතා ආසන්නව පිහිටි, 1 වැනි ශ්‍රේණිය පවත්වන රජයේ පාසැලේ ප්‍රධානයා වෙත, 1973 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. ඉල්ලුම් පත්‍රය පෞද්ගලිකව භාර දෙනු ලැබුවහොත් එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

5. දැනටමත් කොළඹ ආනන්ද විද්‍යාලයට හා විශාඛා විද්‍යාලයට 1 වැනි ශ්‍රේණිය සඳහා ළමයින් බඳවා ගැනීම නවතා ඇත. 1974 වර්ෂයේ සිට කොළඹ නාලන්ද විද්‍යාලයට ද, කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයට ද, කොළඹ ආනන්ද බාලිකා විද්‍යාලයට ද, මොරටුවේ වේල්ස්කුමර විද්‍යාලයට ද, මොරටුවේ වේල්ස්කුමරි විද්‍යාලයට ද, මොරටු මහා විද්‍යාලයට ද, පළමුවැනි ශ්‍රේණිය සඳහා ළමයින් බඳවා ගනු නොලැබේ.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජූලි මස 10 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

1974 වර්ෂය සඳහා......................................පාසැලේ 1 වැනි ශ්‍රේණියට ඇතුළුවීම සඳහා ඉල්ලුම් පත්‍රය

ළමයා පිළිබඳ විස්තර :

1. සම්පූර්ණ නම :————.
2. ස්ත්‍රී පුරුෂ භාවය :————.
3. ඉගැනීමේ මාධ්‍යය :————.
4. (i) උපන් දිනය :————.
   (ii) 1974 ජනවාරි මස 31 වැනි දිනට වයස :
   අවුරුදු :————. මාස :————. දින :————.

දෙමාපියන් පිළිබඳ විස්තර :

| | මව | පියා/නීත්‍යානුකූල භාරකරු |
|---|---|---|
| 5. සම්පූර්ණ නම | | |
| 6. (අ) රටවැසි භාවය<br>(ආ) ජාතිය | | |
| 7. ආගම | | |
| 8. පදිංචි ස්ථානය (ලිපිනය)<br>අංකය<br>පාර<br>නගරය<br>ග්‍රාම සේවක කොට්ඨාශය | | |
| 9. පදිංචි ස්ථානයේ සිට පාසලට කෙටිම දුර (දම්වැල් වලින්) | | |
| 10. ඉහත ලිපිනයේ දැක්වෙන ස්ථානයේ පදිංචියට ආ දිනය | | |
| 11. 10 වැනි කොටුවේ සඳහන් දිනයට කලින් පදිංචිව සිටි ස්ථානයේ ලිපිනය | | |
| 12. ඔබ ගෘහ මූලිකයා ද ? | | |
| 13. ඔබ ගෘහ මූලිකයා නොවන කල ගෘහ මූලිකයාට ඇති ඔබේ සම්බන්ධය | | |

මගේ ළමයා කිසිම රජයේ හෝ පෞද්ගලික හෝ අනුමත හෝ පාසලකට නොයන බවත්, එවැනි පාසලකට නොගිය බවත්, මෙයින් ප්‍රකාශ කර සිටිමි. යථෝක්ත විස්තර නිවැරදි බව ප්‍රකාශ කරන අතරම, ඉහත දී ඇති ලිපිනයේ මා පදිංචිව සිටින බවට ප්‍රමාණවත් සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමට ද මම එකඟ වෙමි. තවද, මවිසින් සපයා ඇති විස්තර කිසිවක් වැරදි සහගත බව අනාවරණය වුවහොත්, මගේ ළමයා පාසැලෙන් අස්කර, දෙපාර්තමේන්තුව මඟින් නම් කරනු ලබන ප්‍රදේශයේ වෙනත් පාසලකට ඔහු/ඇය ඇතුළත් කිරීමට ද එකඟ වෙමි.

————,
පියාගේ/මවගේ/නීත්‍යානුකූල භාරකරුගේ
අත්සන.

දිනය :————.

7-647 73.07.20 වැනි දින අංක 69 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

උපලේඛනය

1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජුලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.27 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.04 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.18 | බදාදා | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. සිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.